## 15. මූල්‍ය කළමනාකරණය

268. මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ,
(1) ව්‍යාපාරයේ ලාභය උපරිම කිරීම යි.
(2) ව්‍යාපාරයේ ඉපයුම උපරිම කිරීම යි.
(3) ව්‍යාපාරයේ හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි ධනය උපරිම කිරීම යි.
(4) ව්‍යාපාරයේ ද්‍රවශීලතා ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම යි.
(5) ව්‍යාපාරයේ දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම යි.

(………)

269. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක් විසින් ගනු ලබන ආයෝජන තීරණ කිහිපයකි.
A - ණයගැතියන් පිළිබඳ තීරණ
B - ව්‍යාපාරය නවීකරණය පිළිබඳ තීරණ
C - වෙළෙඳ තොග පිළිබඳ තීරණ
D - කාරක ප්‍රාග්ධන පිළිබඳ තීරණ
E - ව්‍යාපාරයේ විවිධාංගීකරණය පිළිබඳ තීරණ
F - ව්‍යාපාරය වැඩි දියුණු කිරීම පිළිබඳ තීරණ

ඉහත ආයෝජන තීරණ අතරෙන් දිගු කාලීන / කෙටි කාලීන ආයෝජන තීරණ ලෙස දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

(1) ACD / BEF (2) BCD / AEF
(3) BEF / ACD (4) AEF / BCD
(5) DEF / ABC

(………)

270. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක විවිධ අරමුදල් සම්පාදන මාර්ගයන් ය.
A - කොටස් නිකුතුව B - ණයකර නිකුතුව
C - රඳවා ගත් ලාභ D - ක්ෂය වෙන් කිරීම්
E - වාණිජ පත්‍රිකා F - බැංකු අයිරා

මෙම අරමුදල් සම්පාදන මාර්ග අතරෙන් දිගු කාලීන ඍජු අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග හා දිගු කාලීන ඍජු බාහිර මූල්‍ය සම්පාදන මාර්ග පිළිවෙළින් දැක්වෙන පිළිතුර ඇතුළත් වරණය වන්නේ,

(1) A, B හා C, D ය. (2) A, B හා E, F ය.
(3) C, D හා A, B ය. (4) C, D හා E, F ය.
(5) E, F හා C, D ය.

(………)



National Institute of Education

271. මූල්‍ය කළමනාකරුවන් සිය ආයතනයේ මූල්‍ය අවශ්‍යතා සපුරා ගන්නා මාර්ග පිළිබඳ ව අවධානය යොමු කරයි. එහි දී ඔහු අවධානය යොමු කළ යුතු සාධක කීපයක් පහත දැක්වේ. එම සාධක අතරෙන් මූල්‍ය කළමනාකරණයේ විශේෂ අවධානය යොමු නොකරන සාධකය වන්නේ මින් කවරක් ද?

(1) අවශ්‍ය අරමුදල් ප්‍රමාණය හා අවශ්‍ය වන කාලය.

(2) අරමුදල් සපයා ගැනීමේ පිරිවැය හා තැබිය යුතු ඇප සුරැකුම්.

(3) ව්‍යාපාර සංවිධානයේ ස්වභාවය හා ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුහයට වන බලපෑම.

(4) අරමුදල් ආයෝජනය කරන ව්‍යාපෘතියේ ස්වභාවය හා ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ.

(5) ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව හා ව්‍යාපාරය යොදා ගන්නා තාක්ෂණය.

(………)

272. මූල්‍ය කළමනාකරුවකු විසින් සම්පාදනය කර ගනු ලබන අරමුදල් යෙදවිය හැකි මාර්ග කීපයක් පහත දැක්වේ.

A - ස්ථාවර වත්කම් මිලට ගැනීම.

B - කොටස් මිල දී ගැනීම.

C - විවිධ ද්‍රව්‍ය මිල දී ගැනීම.

D - විවිධ වියදම් ගෙවා දැමීම.

E - ව්‍යාපාරය පුළුල් කිරීම හා නවීකරණය කිරීම.

මෙම අරමුදල් යෙදවුම් මාර්ග අතරෙන් කෙටිකාලීන අරමුදල් යෙදවුම් මාර්ග වන්නේ,

(1) A, G (2) B, C (3) C, D (4) B, D (5) D, E

(………)

273. මූල්‍ය කළමනාකරණයේ දි අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීමට උපයෝගී ගර ගන්නා මූල්‍ය ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය ලේඛනය, මුදල් අයවැය ලේඛනය

(2) විකුණුම් අයවැය ලේඛනය, ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(3) මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, නිෂ්පාදන අයවැය ලේඛනය

(4) ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(5) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, විකුණුම් අයවැය ලේඛනය

(………)

National Institute of Education

- සී/ස හඳගල පොදු සමාගමේ මූල්‍ය වාර්තාවලින් උපුටා ගන්නා ලද පහත තොරතුරු මඟින් 274, 275 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| ජංගම වත්කම් | 160, 000 | |
| අවසන් තොගය | 40, 000 | |
| ජංගම වගකීම් | 80, 000 | |
| විකුණුම් | 90, 000 | |
| දළ ලාභය | | 24, 000 |
| ශුද්ධ ලාභය (බදු පෙර) | | 18, 000 |

274. සී/ස හඳගල පොදු සමාගමේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාත පිළිවෙළින් නිවැරදි ව දක්වා ඇත්තේ,

(1) 4 : 3 හා 2 : 1 ලෙස ය.
(2) 2 : 2 හා 2 : 1 ලෙස ය.
(3) 2 : 1 හා 2 : 3 ලෙස ය.
(4) 2 : 2 හා 3 : 4 ලෙස ය.
(5) 2 : 1 හා 3 : 2 ලෙස ය.

(………)

275. සී/ස හඳගල සමාගමේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් නිවැරදි ව දැක්වෙන්නේ,

(1) 26.66% හා 20%
(2) 20% හා 26.66%
(3) 26.66% හා 26%
(4) 26% හා 26.66%
(5) 20% හා 26%

(………)

276. ණයගැති පිරිවැටුම් අනුපාතය ගණනය කරනු ලබන නිවැරදි ආකාරය වන්නේ,

(1) විකුණුම් / මුළු වත්කම්
(2) ණයට විකුණුම් / සාමාන්‍ය තොගය
(3) ණයට විකුණුම් / සාමාන්‍ය ණයගැතියෝ
(4) සාමාන්‍ය ණයගැතියෝ / ණයට විකුණුම්
(5) විකුණූ භාණ්ඩවල පිරිවැය / සාමාන්‍ය තොගය

(………)

National Institute of Education

277. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට අයත් සංරචක පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
   (1) මූල්‍ය වෙළෙඳ පොළ, මූල්‍යායතන, මධ්‍යම බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, මූල්‍ය උපකරණ
   (2) මධ්‍යම බැංකුව, මූල්‍ය උපකරණ, මූල්‍ය වෙළෙඳ පොළ, මූල්‍යායතන, මූල්‍ය යටිතල පහසුකම්
   (3) මධ්‍යම බැංකුව, කොටස් වෙළෙඳ පොළ, මූල්‍ය වෙළෙඳ පොළ, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු
   (4) කොටස් වෙළෙඳ පොළ, මූල්‍ය වෙළෙඳ පොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ, භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ, අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ
   (5) මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ, මුදල් වෙළෙඳ පොළ, කොටස් වෙළෙඳ පොළ, මූල්‍ය වෙළෙඳ පොළ

(………)

278. රක්‍ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල හා රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල යනාදිය ඇතුළත් මූල්‍ය ආයතන හඳුන්වන්නේ,
   (1) අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන ලෙස ය.
   (2) තැන්පතු භාර ගන්නා අනිකුත් මූල්‍ය ආයතන ලෙස ය.
   (3) ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන ලෙස ය.
   (4) බැංකු අංශය ලෙස ය.
   (5) අනෙකුත් නියාමන ආයතන ලෙස ය.

(………)

279. රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරිත්වය හා ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ආධාර වන ගෙවීම් පියවීම් පද්ධතිය හැඳින්වෙන නම කුමක් ද?
   (1) තත්කාලීන දළ පියවීම් පද්ධතිය
   (2) ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය
   (3) නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය
   (4) ජගත් අන්තර් බැංකු සන්නිවේදන සංගමය
   (5) මූල්‍ය යටිතල පහසුකම්

(………)

280. මූල්‍ය උපකරණවල කල්පිරීමේ කාලය පදනම් කර ගෙන මූල්‍ය වෙළෙඳ පොළ වර්ග කෙරෙන ආකාරය වන්නේ,

(1) ප්‍රාථමික වෙළෙඳ පොළ හා ද්විතීක වෙළෙඳ පොළ ලෙස ය.

(2) මුදල් වෙළෙඳ පොළ හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ ලෙස ය.

(3) භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ හා කොටස් වෙළෙඳ පොළ ලෙස ය.

(4) භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ හා කොටස් වෙළෙඳ පොළ ලෙස ය.

(5) සාංගමික බැඳුම්කර වෙළෙඳ පොළ හා වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ ලෙස ය.

(………)

281. මූල්‍ය වෙළෙඳ පොළ කාර්ය කීපයක් පහත දැක්වේ.

A - වාණිජ බැංකුවක් තවත් වාණිජ බැංකුවකින් දින තුනකින් පියවීමට ණයක් ගැනීම.

B - අපනයනකරුවන් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවකට විකුණා ශ්‍රී ලංකා රුපියල් ලබා ගැනීම.

C - ආයෝජකයන් භාණ්ඩාගාර බැඳුම්කර මිල දී ගැනීම.

D - ආයෝජකයන් තමා මිල දී ගත් කොටස් ද්විතීයික වෙළෙඳ පොළේ අලෙවි කිරීම.

E - රාජ්‍ය සංස්ථාවලට අරමුදල් සපයා ගැනීම සඳහා ණයකර නිකුත් කිරීම.

ඉහත කාර්ය අතරෙන් පිළිවෙළින් මුදල් වෙළෙඳ පොළට හා ප්‍රාග්ධන වෙළෙඳ පොළට අයත් කාර්ය නිවැරදි ව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A, D හා B, C, E ය.

(2) C, D, E හා A, B ය.

(3) A, B, C හා D, E ය.

(4) A, B හා C, D, E ය.

(5) B, C හා A, D, E ය.

(………)

282. ලැයිස්තු ගත සමාගම්වල කොටස් මිල දී ගැනීම හා විකිණීම පරිපාලනය කරනු ලබන ආයතනය කුමක් ද?

(1) ඒකක භාර අරමුදල

(2) ශ්‍රී ලංකා සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව

(3) සී/ස කොළඹ කොටස් හුවමාරු (ඇපකාර) සමාගම

(4) ශ්‍රී ලංකා මහ බැංකුව

(5) මුදල් අමාත්‍යාංශය

(………)

National Institute of Education

283. වර්තමානයේ (2018) කොළඹ කොටස් වෙළඳ පොළේ සමාගම් ලැයිස්තු ගත කිරීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා පදනම් කර ගෙන පුවරු දෙකක ලැයිස්තු ගත කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතා අතරෙන් දිරිසවි පුවරුවේ ලැයිස්තු ගත කිරීමට පමණක් අදාළ වන එක් කොන්දේසිය වන්නේ,

(1) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 500ට නොඅඩු වීම.

(2) නිකුත් කර ඇති ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් 25% මහජනයාට සතු වීම.

(3) ලැයිස්තුගත කිරීමේ ඉල්ලීමට පෙර අවම වශයෙන් වර්ෂ 3ක් බදු පෙර ලාභ ලබා තිබීම.

(4) ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 100 නො අඩු වීම.

(5) ශුද්ධ වත්කම් ආසන්න වසර දෙකක විගණනය කරන මූල්‍ය වාර්තා මගින් තහවුරු කර තිබීම.

(………)

284. කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) සාමාන්‍ය කොටස්, කොටස් බලපත්‍ර, කොටස් සහතික පත්‍ර, සාංගමික ණයකර, රජයේ සුරැකුම්පත්

(2) වරණීය කොටස්, කොටස් සහතික පත්‍ර, ඉල්ලුම් තැන්පතු, සාංගමික ණයකර, කොටස් බලපත්‍ර

(3) රජයේ සුරැකුම්පත්, වාණිජ පත්‍රිකා, තැන්පතු සහතික, සාමාන්‍ය කොටස්, වරණීය කොටස්

(4) රජයේ සුරැකුම්පත්, සාංගමික ණයකර, කොටස් බලපත්‍ර, වරණීය කොටස්, සාමාන්‍ය කොටස්

(5) වරණීය කොටස්, භාණ්ඩාගාර බැඳුම්කර, සාංගමික බැඳුම්කර, පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත්

(………)

285. සමාගමේ දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට කිසියම් අනුපාතයකට අනුව කොටස් නැවත ලබා දීම

(1) සංචිත ප්‍රාග්ධනීකරණය යි.

(2) හිමිකම් නිකුතුව යි.

(3) ප්‍රසාද කොටස් නිකුතුව යි.

(4) සාංගමික ණයකර නිකුතුව යි.

(5) කොටස් බලපත්‍ර ලබා දීම යි.

(………)

286. සුරැකුම්පත්වල ආයෝජනයෙන් ලැබෙන වක්‍ර ප්‍රතිලාභ පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) ලාභාංශ හිමි වීම, පොලී හිමි වීම, අධ්‍යක්ෂවරයකු ලෙස පත් විය හැකි වීම, ප්‍රාග්ධන ලාභ හිමි වීම

(2) ලාභාංශ හිමි වීම, හිමිකම් නිකුතුව හා ප්‍රසාද නිකුතුවලට හිමිකම් ලැබීම, අවදානම් අඩු වීම

(3) ලාභාංශ, අධ්‍යක්ෂවරයකු ලෙස පත් විය හැකි වීම, ප්‍රාග්ධන ලාභ බද්දෙන් නිදහස් වීම, පොලී හිමි වීම

(4) ඡන්ද බලය හිමිවීම, ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම, ප්‍රාග්ධන ලාභ හිමිකර ගැනිමට හැකි වීම, ප්‍රසාද නිකුතුවට හිමිකම් ලැබීම

(5) ලාභාංශ, ප්‍රාග්ධන ලාභ, හිමිකම් නිකුතුව, ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම

(………)

287. කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ විශාලතම වඩාත් ද්‍රවශීල සමාගම් 20 හි මිල ගණන්වල වෙනස්වීම මැනීම සඳහා ගණනය කරනු ලබන දර්ශකය වන්නේ,

(1) සියලු කොටස් මිල දර්ශකය යි. (2) මිලංකා මිල දර්ශකය යි.

(3) S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය යි. (4) මුළු ප්‍රතිලාභ දර්ශකය යි.

(5) MBSL මිඩ් කැප් දර්ශකය යි.

(………)

288. කොළඹ කොටස් හුවමාරුවේ කටයුතු අධීක්ෂණය කරනු ලබන ආයතනය වන්නේ,

(1) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (2) කොළඹ කොටස් වෙළෙඳ පොළ

(3) මධ්‍යම තැන්පතු ක්‍රම සමාගම (4) තැරැව්කාර සමාගම්

(5) ලැයිස්තුගත සමාගම්

(………)

289. වත්කම්වල ආයෝජනය හා ඒවායින් ජනිත කරන ඉපයීම් අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කරන අනුපාතය වන්නේ,

(1) හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (2) ක්‍රියාකාරී අනුපාතය

(3) තෝලන අනුපාතය (4) ජංගම අනුපාතය

(5) ද්‍රවශීලතා අනුපාතය

(………)

## ප්‍රශ්න සඳහා පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 5 | 46 | 3 | 91 | 2 | 136 | 2 | 181 | 4 |
| 2 | 1 | 47 | 2 | 92 | 4 | 137 | 2 | 182 | 1 |
| 3 | 3 | 48 | 3 | 93 | 1 | 138 | 3 | 183 | 4 |
| 4 | 3 | 49 | 4 | 94 | 1 | 139 | 5 | 184 | 2 |
| 5 | 2 | 50 | 3 | 95 | 5 | 140 | 5 | 185 | 2 |
| 6 | 3 | 51 | 5 | 96 | 1 | 141 | 3 | 186 | 2 |
| 7 | 3 | 52 | 5 | 97 | 3 | 142 | 3 | 187 | 3 |
| 8 | 4 | 53 | 3 | 98 | 3 | 143 | 2 | 188 | 5 |
| 9 | 3 | 54 | 1 | 99 | 4 | 144 | 2 | 189 | 1 |
| 10 | 4 | 55 | 5 | 100 | 3 | 145 | 4 | 190 | 5 |
| 11 | 2 | 56 | 2 | 101 | 1 | 146 | 3 | 191 | 4 |
| 12 | 1 | 57 | 4 | 102 | 2 | 147 | 2 | 192 | 3 |
| 13 | 3 | 58 | 3 | 103 | 1 | 148 | 2 | 193 | 3 |
| 14 | 1 | 59 | 1 | 104 | 5 | 149 | 5 | 194 | 3 |
| 15 | 3 | 60 | 1 | 105 | 2 | 150 | 4 | 195 | 2 |
| 16 | 1 | 61 | 1 | 106 | 5 | 151 | 1 | 196 | 5 |
| 17 | 3 | 62 | 2 | 107 | 4 | 152 | 4 | 197 | 1 |
| 18 | 5 | 63 | 2 | 108 | 2 | 153 | 3 | 198 | 1 |
| 19 | 2 | 64 | 4 | 109 | 2 | 154 | 4 | 199 | 1 |
| 20 | 3 | 65 | 3 | 110 | 2 | 155 | 4 | 200 | 4 |
| 21 | 4 | 66 | 2 | 111 | 2 | 156 | 2 | 201 | 1 |
| 22 | 1 | 67 | 3 | 112 | 3 | 157 | 1 | 202 | 5 |
| 23 | 5 | 68 | 5 | 113 | 4 | 158 | 2 | 203 | 5 |
| 24 | 4 | 69 | 2 | 114 | 2 | 159 | 1 | 204 | 4 |
| 25 | 4 | 70 | 1 | 115 | 1 | 160 | 5 | 205 | 5 |
| 26 | 4 | 71 | 2 | 116 | 1 | 161 | 2 | 206 | 1 |
| 27 | 5 | 72 | 5 | 117 | 4 | 162 | 2 | 207 | 5 |
| 28 | 2 | 73 | 5 | 118 | 5 | 163 | 3 | 208 | 2 |
| 29 | 4 | 74 | 4 | 119 | 4 | 164 | 2 | 209 | 2 |
| 30 | 1 | 75 | 3 | 120 | 2 | 165 | 5 | 210 | 4 |
| 31 | 2 | 76 | 1 | 121 | 3 | 166 | 4 | 211 | 5 |
| 32 | 1 | 77 | 4 | 122 | 1 | 167 | 2 | 212 | 2 |
| 33 | 3 | 78 | 3 | 123 | 5 | 168 | 3 | 213 | 3 |
| 34 | 1 | 79 | 4 | 124 | 5 | 169 | 3 | 214 | 5 |
| 35 | 1 | 80 | 3 | 125 | 2 | 170 | 5 | 215 | 2 |
| 36 | 4 | 81 | 4 | 126 | 4 | 171 | 5 | 216 | 5 |
| 37 | 4 | 82 | 2 | 127 | 2 | 172 | 5 | 217 | 3 |
| 38 | 1 | 83 | 3 | 128 | 3 | 173 | 5 | 218 | 2 |
| 39 | 1 | 84 | 3 | 129 | 4 | 174 | 1 | 219 | 4 |
| 40 | 3 | 85 | 2 | 130 | 3 | 175 | 1 | 220 | 5 |
| 41 | 2 | 86 | 4 | 131 | 2 | 176 | 5 | 221 | 2 |
| 42 | 3 | 87 | 3 | 132 | 3 | 177 | 1 | 222 | 4 |
| 43 | 2 | 88 | 2 | 133 | 4 | 178 | 3 | 223 | 3 |
| 44 | 2 | 89 | 4 | 134 | 4 | 179 | 4 | 224 | 2 |
| 45 | 1 | 90 | 5 | 135 | 5 | 180 | 5 | 225 | 4 |

National Institute of Education

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 226 | 1 | 251 | 4 | 276 | 3 | 301 | 2 | 326 | 1 |
| 227 | 5 | 252 | 4 | 277 | 2 | 302 | 5 | 327 | 1 |
| 228 | 2 | 253 | 1 | 278 | 3 | 303 | 4 | 328 | 2 |
| 229 | 5 | 254 | 5 | 279 | 5 | 304 | 3 | 329 | 4 |
| 230 | 5 | 255 | 3 | 280 | 2 | 305 | 3 | 330 | 1 |
| 231 | 2 | 256 | 5 | 281 | 4 | 306 | 2 | 331 | 3 |
| 232 | 1 | 257 | 5 | 282 | 3 | 307 | 3 | 332 | 1 |
| 233 | 2 | 258 | 4 | 283 | 4 | 308 | 5 | 333 | 4 |
| 234 | 5 | 259 | 5 | 284 | 4 | 309 | 3 | 334 | 1 |
| 235 | 2 | 260 | 3 | 285 | 2 | 310 | 3 | 335 | 3 |
| 236 | 3 | 261 | 4 | 286 | 4 | 311 | 5 | 336 | 2 |
| 237 | 4 | 262 | 3 | 287 | 3 | 312 | 3 | 337 | 5 |
| 238 | 4 | 263 | 2 | 288 | 1 | 313 | 1 | 338 | 1 |
| 239 | 3 | 264 | 1 | 289 | 2 | 314 | 1 | 339 | 3 |
| 240 | 2 | 265 | 2 | 290 | 2 | 315 | 1 | 340 | 3 |
| 241 | 4 | 266 | 2 | 291 | 4 | 316 | 1 | 341 | 5 |
| 242 | 4 | 267 | 3 | 292 | 1 | 317 | 4 | 342 | 2 |
| 243 | 3 | 268 | 3 | 293 | 1 | 318 | 5 | 343 | 1 |
| 244 | 5 | 269 | 1 | 294 | 5 | 319 | 2 | 344 | 5 |
| 245 | 2 | 270 | 3 | 295 | 4 | 320 | 3 | 345 | 2 |
| 246 | 4 | 271 | 5 | 296 | 2 | 321 | 3 | 346 | 3 |
| 247 | 5 | 272 | 3 | 297 | 3 | 322 | 2 | 347 | 3 |
| 248 | 3 | 273 | 4 | 298 | 3 | 323 | 2 | 348 | 2 |
| 249 | 3 | 274 | 5 | 299 | 2 | 324 | 3 | 349 | 1 |
| 250 | 3 | 275 | 1 | 300 | 4 | 325 | 4 | 350 | 3 |

National Institute of Education

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."